**සොරණාතොට ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
-----------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 21 දිනද ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 20 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 **මතය**
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට සොරණාතොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
------------------------

පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දෙසැම්බර් 31 දිනට වූ බැංකු ශේෂය රු.54,813 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.57,630 ක් වූ සේවක ඇප තැන්පත් ශේෂය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේදී ලද ගැල්වනයිස් කොඩි කණු 167 ක වටිනාකම වූ රු.211,583 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ ලද බහුකාර්ය ජංගම කුටි 03 ක වටිනාකම වූ රු.79,500 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී සභාවේ වත්කම් සංවර්ධනය හා ඉදිකිරීම සඳහා දරන ලද රු.433,920 ක වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ හිඟ මුද්දර ගාස්තු ආදායම්හි ඇතුළත් ඉකුත් වර්ෂවලට අදාල රු.251,361 ක් වූ වැඩිපුර බිල්කිරීම් වටිනාකම සමුච්චිත අරමුදලට ගලපා නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ හිඟ උසාවි දඩ ආදායම්හි ඇතුළත් ඉකුත් වර්ෂවලට අදාල රු.162,198 ක් වූ වැඩිපුර බිල්කිරීම් වටිනාකම සමුච්චිත අරමුදලට ගලපා නොතිබුණි.

(ඌ) දේශීය ණය හා සංවර්ධන අරමුදල සඳහා සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද වාරිකවල ඇතුළත් රු.132,364 ක පොලී මුදල දේශීය ණය හා සංවර්ධන අරමුදල් ගිණුමට හර කර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල දේශීය ණය හා සංවර්ධන අරමුදල් ණය වාරිකයේ ඇතුළත් රු.65,948 ක පොලී මුදල ප්‍රාග්ධන වැයක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ඉකුත් වර්ෂයට අදාල කර්මාන්ත ණයහිමි ශේෂය රු.378,554 කින් වැඩිපුර දක්වා තිබුණි.

(ඔ) 2015 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි ශේෂය රු.1,800,271 ක් වැඩිපුර දක්වා තිබුණි.

(ඕ) රු.24,376 ක් වූ ඉකුත් වර්ෂයේ විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේ වැයක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.3.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.22,081,539 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.31,064,652 ක් විය.

1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

(අ) රු. 647,601,410 ක් වටිනා ගිණුම් විෂයයන් 05 ක්, වටිනාකම් සහිත උපලේඛන සහ ආදායම් විස්තර ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) දේශීය ණය හා සංවර්ධන අරමුදල් ණය වෙනුවෙන් තබන ලද රු.3,607,770 ක් වූ ඇප සුරක්ෂිත මුදල පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියක් රහිතව ලබාගෙන තිබූ නමුත්, වැයකිරීම් සම්බන්ධයෙන් විගණනයට තහවුරු නොවීය.

1.3.4 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) හා (ඔ) | විෂහාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය පනතේ සහිතව දැරිය යුතු නමුත් අවස්ථා 13 කදී දරන ලද එකතුව රු.359,085 ක් වූ ගෙවීම් සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියක් ලබාගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ.104 | සභාවේ කැබ් රථ අනතුර සිදුවී මාස 16 ට අධික කාලයක් ගතවී තිබුණද, ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | මු.රෙ.395 (ඇ) | 2014 දෙසැම්බර් 31 දිනෙන් පසුව බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. |
| (iii) | මු.රෙ.396 | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකර මාස 06 ක් ඉක්මවූ රු.76,746 ක් වූ චෙක්පත් 13 ක් ආදායමට ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 1:6 වගන්තිය | ස්ථාන මාරුවීම් ලැබූ සේවකයින් 04 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 06 ඉක්ම වූ එකතුව රු.20,730 ක ණය ශේෂයක් විය. |
| (ඇ) | ඌව පළාත් පාලන කොමසාරිස්ගේ 2015 ජුනි 03 දිනැති අංක 12/1/1 සහා බලතල පැවරීම් සම්බන්ධ ලිපියේ 02 (VII) විධිවිධාන | සභා කබ් රථය සඳහා සීමාව ඉක්මවා අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුල එකතුව රු.92,179 ක ඉන්ධන ලබාගෙන තිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,704,357 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.959,242 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

---------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.692,343 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.1,555,708 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

3.1 **අවිධිමත් ගනුදෙනු**

----------------------

සභාවේ කැබ් රථය අනතුරට භාජනය වී මාස 16 ක් ගතවී තිබුණද වගකිව යුතු පාර්ශව හඳුනා නොගෙන ලියාපදිංචි නොවූ ගරාජයක් වෙත රු.1,257,800 ක් ගෙවීම් කර අළුත්වැඩියා කර තිබුණි.

3.2 **ආර්ථික නොවූ ගනුදෙනු**

--------------------------

අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා ස්ථිර ක්ෂේත්‍ර කම්කරු හා සෞඛ්‍ය කම්කරුවන් 09 ක් සේවයේ නිරතව සිටියදී 2015 වර්ෂයේ අනියම් හා ආදේශක පදනම මත සේවකයින් 07 දෙනෙකු සේවයේ යොදවාගෙන ඒ වෙනුවෙන් රු.840,600 ක දෛනික වැටුප් ගෙවා තිබුණි.

3.3 **හඳුනාගත් අලාභ**

-------------------

දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගත් ණය ගෙවීමේ දී ණය කොන්දේසි කඩ කිරීම හා වාරික ප්‍රමාද කිරීම හේතුවෙන් ණය මුදල පියවීම වෙනුවෙන් සභා අරමුදලින් රු.5,102,305 ක අමතර පිරිවැයක් දැරීමට සිදුව තිබුණි.

3.4 **කොන්ත්‍රාත් පරිපාලනය**

----------------------------

පුස්සැල්ලාව මුත්තෙට්ටුවකුඹුර අත්වැල් පාලම ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුට 2014 සැප්තැම්බර් 01 දින ගෙවා තිබූ රු.100,000 ක අත්තිකාරම් පියවා නොතිබුණි.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

----------------------------------------

4.1 **අයවැය පාලනය**

------------------

සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ අයවැයගත ආදායම් හා වියදම් පාලනය කිරීම සඳහා අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

-----------------------

2015 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

---------------------------------------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කර නොතිබුණි.

5. **පද්ධති හා පාලනය**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) තොග පාලනය
(ඉ) වාහන පාලනය
(ඊ) කොන්ත්‍රාත් පාලනය
(උ) වත්කම් කළමනාකරණය